රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 27/94

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1994 ජූලි මස 25 දින.

සියළුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

<u>මධ්‍යම මට්ටමේ ඒකාබද්ධ කාර්මික සේවා ප්‍රතිව්‍යුහගත කිරීම.</u>

1994 ජූලි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මධ්‍යම මට්මේ ඒකාබද්ධ කාර්මිත සේවා ව්‍යවස්ථාවට පහත දක්වෙන සංශෝධනයන් කිරීමට රජය තීරණය කර ඇත.

02. "මධ්‍යම මට්ටමේ ඒකාබද්ධ කාර්මික සේවය" "ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවය" යනුවෙන් හැඳින්වෙනු ඇත.

03. මධ්‍යම මට්ටමේ ඒකාබද්ධ කාර්මික සේවා ව්‍යවස්ථාවේ VII වන පරිච්ඡේදයේ 1:3 ඡේදයේ දක්වෙන පන්ති හා වැටුප් පරිමාණයන් වෙනුවට පහත දක්වෙන පනත් හා වැටුප් පරිමාණයන් ක්‍රියාත්මක කෙරේ.

II 'ආ' පන්තිය (බඳවා ගැනීමේ පන්තිය)
වාර්ෂිකව රු. 30060 - 5 x 660 - 11 x 780 - 41940
II 'අ' පන්තිය වාර්ෂිකව රු. 37200 - 4 x780 - 14 x1200 - 57120
I වන පන්තිය වාර්ෂිකව රු. 42720 - 8 x 1200 - 10 x1560 - 67920
විශේෂ පන්තිය වාර්ෂිකව රු. 49200 - 15 x 1560 - 72600

04. මධ්‍යම මට්ටමේ ඒකාබද්ධ කාර්මික සේවයේ දැනටමත් නියුතු නිලධාරීන් පහත දක්වෙන නව පන්ති වලට අන්තර්ග්‍රහනය කෙරෙනු ඇත.

දැනට II වන පන්තියේ සිටින නිලධාරීන් නව II 'ආ' පන්තියට
දැනට II 'ආ' - එම - නව II 'අ' පන්තියට
දැනට II 'අ' - එම - නව I වන පන්තියට
දැනට I වන - එම - නව විශේෂ පන්තියට

04.01. අන්තර්ග්‍රහණය කිරීම අආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4 වන ඡේදයේ දක්වෙන නියමයන්ට අනුව විය යුතුය.

05. වයස අවුරුදු 45 සම්පූර්ණ කරන නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම්වලින් නිදහස් කරනු ඇත.

06. මේ අනුව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

අ.කලේ/(වයි.බී.පුස්සෙදෙනිය)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.